290

RARE

# කාන්තාව සහ නව දැනුම

(දේශීය ගැමි කාන්තාවන්ගේ නව දැනුම්/තොරතුරු උපාර්ජනය සහ භාවිතය පිළිබඳ සංවර්ධන සන්නිවේදන අධ්‍යයනයකි.)

ආශිර්දිනි භාග්‍යා අත්තනායක

කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන පිළිබඳ දර්ශනපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2002- පෙබරවාරි



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 290 |
| වර්ග අංකය | |

## සාර සංග්‍රහය

දේශීය ගැමි කාන්තාවන්ගේ තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය හා එමගින් සිදුවී ඇති වෙනස්කම් අධ්‍යයනයේ දී ගැටලු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු විය. දේශීය ගැමි කාන්තාවෝ තොරතුරු හා නවදැනුම ලබා ගැනීමට යොමුවී සිටිත් ද? එසේ යොමුවේ නම් ඒ සඳහා සන්නිවේදන නැඹුරුවක් ඇත්තේ කොයි ආකාරයට ද? එම නව දැනුමේ ස්වභාවය කෙබඳු ද? ඒවා කාන්තාවන්ගේ ජීවන රටාවන් වෙනස් කිරීමට හේතු වී තිබේද? යනාදිය එම ගැටලු කිහිපයයි. මෙම ගැටලුව පදනම් කොටගත් අධ්‍යයනයේ උපන්‍යාසය වන්නේ,

"දේශීය ග්‍රාමීය කාන්තාව නූතන සන්නිවේදන ක්‍රම මගින් තොරතුරු ලබා ගැනීමට වැඩි පෙළඹවීමක් සහ උනන්දුවක් දක්වයි. ඊට අමතරව එම තොරතුරු ඔවුන්ගේ ජීවන රටාවන්හි භෞතික හා මානසික ක්‍රියාකාරකම් බෙහෙවින් නවීකරණයට ලක් කරයි. ඔවුහු සංස්කෘතික හා සමාජීය වශයෙන් වැඩිපුරම වෙනස්කම් ඇති කරගනු ලබන්නේ නව ජනමාධ්‍ය ඇසුරිනි" යන්නයි.

මෙම පර්යේෂණයට අදාල විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමට යොදා ගත් ක්‍රමවේදයට අනුව මුලින්ම දත්ත රැස්කර ගත් ක්‍රමය වූයේ තෝරා ගත් ග්‍රාමීය ප්‍රදේශයක අහඹු ලෙස තෝරාගත් නියැදියකින් නිවාස 100 ක වයස අවු 19 ට වැඩි කාන්තාවන් 100 දෙනෙකු ඇසුරෙන් ප්‍රාථමික දත්ත රැස් කිරීමයි. ඊට අදාලව ඌව ප්‍රදේශයේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්තුඩුවාවෙල ග්‍රාමීය ජන වසම තෝරා ගැනින. ප්‍රාථමික දත්ත රැස්කරගත් ක්‍රම වශයෙන් ප්‍රශ්නාවලිය හා උප ලේඛන ක්‍රම, සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රම භාවිතයට ගැනින. ද්විතීයික මූලාශ්‍ර රැස් කිරීම සඳහා මුද්‍රිත ග්‍රන්ථ ප්‍රකාශන, සගරා, පුවත්පත්, භාවිතයට ගත් අතර පර්යේෂණ කෘති වශයෙන් මේ සම්බන්ධ මෙතෙක් කර ඇති දේශීය හා විදේශීය කෘති ප්‍රයෝජනයට ගැනින. නවතම සමීක්ෂණවල දත්ත හා සංඛ්‍යා ලේඛන, මහ බැංකු වාර්තා හා සමීක්ෂණ ද බෙහෙවින් ප්‍රයෝජනයට ගැනින. අන්තර්ජාලය ඇසුරෙන් ද ද්විතීයික දත්ත රැස් කෙරිණි.

ප්‍රශ්නාවලියේ ප්‍රශ්නවලට අදාල දත්ත කාණ්ඩ අනුව වගු ගත කරමින් විශ්ලේෂණය සිදු කළ අතර ප්‍රස්ථාර භාවිතය මගින් වැඩිදුරටත් පැහැදිලි කරමින් එම සාධක පෙන්නුම් කෙරේ. ඊට අමතරව සම්මුඛ සාකච්ඡා සහ සමීක්ෂණයේ දී කළ නිරීක්ෂණ මගින් ලබා ගත් තොරතුරු ද සුදුසු ලෙස විශ්ලේෂණය කර භාවිතයට ගැනින.

පර්යේෂණයේ නිගමන මෙසේ දැක්විය හැකියි.

1. ශ්‍රී ලාංකීය ගැමි කාන්තාවන් කෙරෙහි ජනමාධ්‍යයන්ගෙන් බෙදා හැරෙන දැනුම හා තොරතුරු උපාර්ජනයේ ඵලදායිතාව අවම ය. මින් පැහැදිලි වන්නේ ජනමාධ්‍ය තොරතුරු පරාසය විශාල වුවත් එහි ඵලදායිතාව ගැමි කාන්තාවන් කෙරෙහි අඩු බවත් ඔවුන්ගේ අනෙකුත් දැනුම හා තොරතුරු මාධ්‍ය පරාසය කුඩා වුවත් එහි ඵලදායිතාව විශාල බවයි.

2. විසුරුවා හරිනු ලබන දැනුම හා තොරතුරු අවබෝධ කර ගැනීමට උචිත සමාන අත්දැකීම් පසුතලයක් නොමැතිකම තොරතුරු ග්‍රහනය වැළකීමට හේතුවේ. මේ නිසා ජනමාධ්‍ය තොරතුරුවලින් කාන්තාවන් වෙත ප්‍රේරණය වන්නේ ඉතා සුළු තොරතුරු ප්‍රමාණයකි.

3. දේශීය ගැමි කාන්තාවන් නිරතුරුවම සමාජ සම්බන්ධතා ජාලයක් ඇසුරෙන් දැනුම හා තොරතුරු අර්ථකථනය කර ගනී.

4. ගැමි කාන්තාවන්ගේ ජන විඥානය තුළ තවමත් සාම්ප්‍රදායික තොරතුරු මාධ්‍ය පිළිබඳ විශ්වාසය ඇත. මේ නිසා එම මාධ්‍ය ජනමාධ්‍යයට වඩා ඔවුන්ට තොරතුරු හා දැනුම ලබා දෙන ප්‍රමුඛයෝ වෙති.

5. ගැමි කාන්තාවන්ගේ මාධ්‍ය නැඹුරුව විමර්ශනයේ දී පැහැදිලි වන්නේ වැඩිම නැඹුරුවක් රූපවාහිනියට ඇති බවයි. පුවත්පත් භාවිතය ඉතා දුර්වලය. රසවින්දන මාධ්‍යයක් වශයෙන් හැරුණු කොට ජීවිතාවබෝධය පිණිස ජනමාධ්‍ය ඔවුන්ට සමීප නැත.

6. දරිද්‍රතාවය, නුගත්කම වැනි ගැටලු දැනුම හා තොරතුරු උපාර්ජනයේ බාධකයෝ වෙත්.

මෙම සාධක කිහිපය පර්යේෂණයේ නිගමන ලෙස දැක්විය හැකිවේ. ඒ අනුව මුලින් ගොඩ නගා ගත් පර්යේෂණ උපන්‍යාසය වන "දේශීය ග්‍රාමීය කාන්තාව නූතන සන්නිවේදන ක්‍රම මගින් තොරතුරු ලබා ගැනීමට වැඩි පෙළඹවීමක් සහ උනන්දුවක් දක්වයි. ඊට අමතරව එම තොරතුරු ඔවුන්ගේ ජීවන රටාවන්හි භෞතික හා මානසික ක්‍රියාකාරකම් බෙහෙවින් නවීකරණයට ලක් කරයි. ඔවුහු සංස්කෘතික හා සමාජීය වශයෙන් වැඩිපුරම වෙනස්කම් ඇති කරගනු ලබන්නේ නව ජනමාධ්‍ය ඇසුරිනි, යන උපකල්පනයේ යම් වෙනසක් ද ඇති විය.